# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය: 011-2868441, 2868442, 2868443 මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
பொது அலுவலகம் සරණ මාවත, රාජගිරිය(10107)
ෆැක්ස්/தொலைநகல்: 011-2868426 தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)

web : www.elections.gov.lk e-mail : info@elections.gov.lk


මගේ අංකය :EC/EDR/08/2019 ඔබේ අංකය : දිනය : 2019.09.16
எனது இல. உமது இல. திகதி

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිසාපතිවරුන්
ආණ්ඩුකාරවර ලේකම්වරුන්
පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්
ව්‍යවස්ථාපිත දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ කලාප අධ්‍යාපන ප්‍රධානීන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
නාගරික කොමසාරිස්වරුන්/ නාගරික ලේකම්වරුන්
නගර සභා/ ප්‍රාදේශීය සභා ලේකම්වරුන්
ව්‍යවස්ථාපිත මණ්ඩල හා එවැනි රාජ්‍ය ආයතන ප්‍රධානීන් සහ එම ආයතනවල සාමාන්‍යාධිකාරිවරුන්

**ජනාධිපතිවරණය - 2019**
**ඡන්ද විමසීම කාලය තුළ නොකළ යුතු දේ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කිරීමට නියමිත විධාන**

2019.08.20 දිනැතිව, මැතිවරණ කොමිෂන් සභාව විසින් ඔබ වෙත එවන ලද අංක EC/EDR/01/2019 හා EC/EDR/08/2019 සහ මහජන මුදල් විශාල වශයෙන් වැයකරමින් දැන්වීම ප්‍රචාරණය කිරීම හා එමගින් නිදහස් හා සාධාරණ මැතිවරණ ක්‍රියාවලියකට ඇති කරනු ලබන බලපෑම යහ දේශපාලනමය ප්‍රචාරක කටයුතු සඳහා රජයේ සේවකයන්, රජයේ වාහන හා වෙනත් උපකරණ යොදා ගැනීම යන මැයෙන් යුතු ලිපිවලට අමතර වශයෙනි.

02. ජනාධිපතිවරණයේ නාමයෝජනා කැඳවීමේ දැන්වීම අදින් දින 14 ක් ඉකුත් වීමට පෙර මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කිරීමට නියමිත අතර ඒ සමගම රජයේ දේපල අයුතු පරිහරණය වැළැක්වීමේ විධාන ද නිකුත් කෙරෙනු ඇත.

03. ව්‍යවස්ථාපිත ඡන්ද විමසීම කාලසීමාවට පෙර ද පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට පත් කිරීමට හේතුවන අනීතික කාර්යයන් රාජ්‍ය නිලධාරීන් විසින් නොකළ යුතු බව අපගේ පෙර සඳහන් ලිපිවලින් යොන්වා දුනිමු.

04. 2018 පෙබරවාරි මස 10 වන දින පැවැත්වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කළ "ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට අයත් යම් නිශ්චල හෝ චංචල දේපල පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන" යන මැයෙන් යුතු අංක 2048/2 හා 2017 දෙසැම්බර් 04 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයේ පිටපතක් මේ සමඟ එවමි.

05. ජනාධිපතිවරණයට අදාළව ද මෙවැනිම ගැසට් නිවේදනයක් නිකුත් කරනු ලබනු ඇති අතර එහිද සඳහන් වනු ඇත්තේ මේ හා සමාන කරුණු බැවින් මෙම නිවේදනය මැනවින් කියවා බලන ලෙසත් එවැනි නියම හෙවත් විධාන, ජනාධිපතිවරණයේ නාමයෝජනා කැඳවීමේ දින සිට වලංගු වන බවත් සලකා මෙම නියමවලට අනුකූලව ක්‍රියා කරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් මෙයින් ඔබ වෙත දන්වා සිටිනු ලැබේ.

06. මෙම පිළිබඳව ඔබගේ සහායක නිලධාරීන් ද අදාළ වන පරිදි අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩල හා ආණ්ඩුකාරවරුන් ද දැනුම්වත් කිරීමට පියවර ගනු මැනවි.

07. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් ලෙස මේ ඉදිරි ජනාධිපතිවරණය පැවැත්වීම සඳහා ඔබගෙන් ලැබෙන සහාය අතිශයින් අගය කරනු ලබන බවද වැඩිදුරටත් දන්වා සිටිනු රිසියෙමි.